**සංස්කරණය/Editor**
අසෝක සුබසිංහ Asoka Subasinghe

**උපදේශක සංස්කාරක**
ජගත් ජේ එදිරිසිංහ Jagath J Edirisinghe

**සංස්කරණ සහය/Asst. Editors**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක**
අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ
මේනකා ජයතිලක

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**පිටු සැකසුම සහ ග්‍රැෆික් නිර්මාණ**
**Page Layout & Graphic Designs**
සාමන්ත තැන්නගේ Saamantha Tennege

**සමබන්ධීකරණය**

| NSW | WA |
|---|---|
| Lakshman Kodituwakku | Kapila Hemantha |
| 02 9626 7660 | Balage |
| 02 9837 5055 | 08 9456 1972 |
| **QLD** | **ACT** |
| Ananda Samaratunga | Asoka Nimalasiri |
| 07 3372 7953 | 0400 429 031 |
| **SA** | **TAS** |
| Chandra Eeriyagama | Anura Seneviratne |
| 08 8331 2318 | 03 6327 4259 |

Sannasa
61 Nettle Drive
Hallam Vic 3803 Australia
Web: www.sannasa.net
email : sannasanews@gmail.com
Tel/Fax : 03 9796 4241

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත.

CIRCULATION - 10000 COPIES IN AUSTRALIA

### සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය ඉතා කෙටියෙන් ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න.

## කම්කරු දිනය හා මැයි දිනය

මැයි පළමු වන දා යනු වැඩ කරන ජනතාවගේ දිනයයි. කම්කරුවන් එකිනෙකා බැඳීමකින් වෙළනු ලබන දිනයයි. දිනාගත් අයිතීන් සමරමින් අනාගතය උදෙසා පෙළ ගැසෙන දිනයයි.

නොරටක වෙසෙන අප ද මව් රටෙහි සිටින සියළු සියළුම වැඩ කරන ජනතාව භුක්ති විඳින සේවක අයිතීන් සටන් කොට දිනාගත් ජයග්‍රහණයන් ය. කිසිදු අයිතියක් බත්දේසියක තබා ජනතාවට නොලැබුණ හෙයින් කම්කරු දිනය අභිමානයෙන් සැමරීමට ශුද්ධ වූ අයිතියක් තිබේ.

කම්කරු දින ඉතිහාසය වනා හි අනේක දුෂ්කරතා මැද පොදු අරමුණු හා අපේක්ෂා වෙනුවෙන් ජීවිත පරිත්‍යාග යෙන් කැපවුණු දහස් සංඛ්‍යාත සැබෑ මිනිසුන්ගේ අත්දැකීම් සමූහයයි. කම්කරු දිනයකදි කම්කරු සටන් හා වෘත්තීය සමිති අපට අමතක කළ නොහේ. කාලයත් සමඟ විවිධ මතවාද සහ ක්‍රියාමාර්ග මැද බේදී විසිරී තිබුණ ද වෘත්තීය සමිති ඉතිහාසය ද තේජාන්විත ය.

යම් අඩුපාඩු තිබුණ ද කම්කරු සටන් ක්‍රියාමාර්ග හරහා වෘත්තීය සමිති විසින් කම්කරු ජනතාව වෙත ලබා දී ඇති ජයග්‍රහණ අපමණ ය. කම්කරුවන්ගේ අප්‍රතිහත ධෛර්යයෙන් ගොඩ නැගුණු කම්කරු දිනය විවිධ දේශපාලන පක්ෂ වල බල ව්‍යාපෘතීන් වර්ධනය කර ගැනීමට යොදා ගන්නා මැයි දිනයක් බවට පත් වී තිබීම කණගාටුදායක ය. කම්කරුවන්ගෙ අයිතීන් ගැන කතා කිරීමට යෙදිය යුතු දිනය තමන්ගෙ පක්ෂයේ හෝ සංවිධානයේ බලය ප්‍රදර්ශනය කිරීමට සහ දේශපාලන කවටයින්ගේ කෙළිබිමක් බවට පත් වීම ඛේදයකි.

කම්කරු දිනය මැයි මාසයේ තවත් එක් රජයේ නිවාඩු දිනයක් පමණක් බවට පත් වීමේ තත්වයට කටයුතු දැන් දැන් සැලසෙමින් තිබෙනු අපට දැනේ. මේ තත්ත්වය වහා වෙනස් විය යුතුය. කම්කරු දිනය යනු මැයි දිනයක් නොව සමස්ථ කම්කරු ජනතාවගේ දිනයක් බවට යළිත් හැරවිය යුතුය. ඒ දිනය වැඩ කරන ජනතාව වෙත මුදා හැර ඇති පීඩනයට එරෙහිව සංවිධානාත්මකව පෙළ ගැසෙන දිනයක් බවට පත් කර ගත යුතුය.



# ත්‍රස්තවාදය නිසා විකෘති වූ දඹදිව වන්දනාව

1966 දී ඕල් ඉන්දියා රේඩියෝ ගුවන් විදුලියේ (ආකාශ්වානි) විදේශ සේවය ඇරැඹූ විට ශ්‍රී ලංකා ගුවන් විදුලියේ තේව්ස් ගුරුගේ මහතා ඉල්ලීමක් කළේය. එනම් වෙසක් පෝදා අලුයම 6.30 සිට 7.00 දක්වා බුද්ධග යාවේ ජය ශ්‍රී මහා බෝ මුල සිට අටසිල් හා බුද්ධ වන්දනා සහිත වැඩසටහනක් ශ්‍රී ලංකා ගුවන් විදුලිය මගින් විසුරුවා හැරීමට විධිවිධාන යෙදිය හැකිද? යන්නයි. මෙය ඉතා පහසුවෙන් ඉෂ්ට කිරීමට අපට හැකි විය.

මේ සඳහා සෑම වෙසක් පෝදාකම දැඩි ග්‍රීෂ්මය ද නොතකා බුද්ධගයාවට යන්නට මට සිදුවිය.

මේ අතර ඇසල පෝදා එවැනි වැඩසටහනක් සාරනාත්හි ඉසිපතනයේ සිට විසුරුවා හැරීමට එවකට එහි මහාබෝධි විහාරාධිපති ආචාර්ය පොතුවිල ගුණරත්න හිමියන් විසින් කරන ලද ඉල්ලීමක් ද සාර්ථක විය.

1967 දී දඹදිව සාංචි විහාරාධිපති හැඩිගල්ලේ පඤ්ඤාතිස්ස හිමියන් විසින් සාංචියේ සිට එබඳු වැඩසටහනක් සංවිධානය කරන ලෙස ඉල්ලීමක් කරන ලද්දේ කොළඹ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයටය. මේ ප්‍රචාරයන් සඳහා විශාල වියදමක් දැරිය යුතු වුවද ඉන්දියානු රජය ඒවා සාර්ථකව ක්‍රියාත්මක කළේය.

සාංචියේ පොසොන් උත්සව දාට පිරිසක් සිටියේ නැත. හැඩිගල්ලේ හාමුදුරුවෝ ද ඒ ගිම්හානයේ සාංචියට වැඩම කරන්නේ නැත. කෙසේ වුවද එකල විහාරයේ පදිංචිව හෝපාල් විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයකු ලෙස ඉගෙනීම කළ බානගල උපතිස්ස හිමියෝ ඒ දුෂ්කර කාරිය මැනැවින් ඉටු කළහ.

මේ කෙටි හැඳින්වීම මා කළේ දඹදිව සිද්ධස්ථාන පිළිබඳව වෙනත් කතාවක් කීමට ප්‍රවේශයක් ගොඩ නඟා ගැනීම සඳහාය.

සංවිධානාත්මකව දඹදිව වන්දනාගමන අරඹන ලද්දේ අනගාරික ධර්මපාලතුමන් විසිනි. ඒ කාලේ වන්දනාකරුවන් දඹදිව ගියේ, "මහා බෝධි වන්දනා නඩය සමඟය. මේ ගමනට මාසයක් ගතවීය. කොළඹ කොටුවෙන් රාත්‍රී තාලෙයිමන්නාරම දුම්රියට නගින වන්දනාකරුවෝ පොල්ගහවෙල, අනුරාධපුරය, මැදවච්චිය, මඩුරෝඩ් හා පේසාලේ දුම්රිය ස්ථාන පසුකොට අලුයම තලෙයිමන්නාරම් තොටට ලඟා වෙති.

එතැන් සිට නෞකාවකින් පෝක් සමුද්‍ර සන්ධිය තරණය කරන වන්දනා නඩය සැතපුම් 22ක් ගෙවා ඉන්දියාවේ දනුස්කොඩියට ළඟා වෙයි. එතැන් සිට පාම්බන් පාලමෙන් එගොඩ

33 වන පිටුවට

***මේ විස්මය ජනක සැදැහැවත් චාරිකාවට කණ කොකා හඬන්නට පටන් ගැනුණේ 1985න් පසුවය. උතුරේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය අවසන් කරමින් ප්‍රභාකරන් නමැති ත්‍රස්තවාදී නායකයා දෙමළ ජනතාවගේ මුක්ති සටන කොල්ලකා ගැනීම සමඟම ඔහු මුලින්ම විනාශ කර දැම්මෙ මුළු උතුරු පළාත පුරා විහිදී ගිය දුම්රිය මාර්ගයි. වවුනියාවේ සිට කන්කසන්තුරේ දක්වාත් මඩුරෝඩ් සිට තලෙයිමන්නාරම දක්වාත් තිබූ සෑම රේල් පීල්ලක්ම, සෑම සිල්පර කොටයක්ම ත්‍රස්තවදීන් ගේ බංකර සෑදීමට මහෝපකාරී විය. අදත් ඔවුන් අන්තිම සටන ගෙන යන්නේ ඒ බංකර් තුළ සිටය.***



*ඉන්දියාවේ හිටපු නියෝජ්‍ය මහ කොමසාරිස්*

එස්. පියසේන